# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2180/40 - 2020 ජුනි මස 21 වැනි ඉරිදා - 2020.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) (අ) වගන්තිය යටතේ අක්කරෙයිපත්තු මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මියයාම හේතුකොට ගෙන අක්කරෙයිපත්තු මහ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ අක්කරෙයිපත්තු මහ නගර සභාවේ අංක 11 - ප්‍රධාන පල්ලිය කොට්ඨාසයට තේරී පත් වූ මුහම්මදු ආරිදීන් සිත්ති නුරුල් අයින් අයත් වන්නා වූ ජාතික කොංග්‍රසය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අක්කරෙයිපත්තු මහ නගර සභාවේ අංක 11 - ප්‍රධාන පල්ලිය කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ෆයිසර් ෆාතිමා සම්හා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

අක්කරෙයිපත්තු මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි, දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) (අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ෆයිසර් ෆාතිමා සම්හා, අක්කරෙයිපත්තු මහ නගර සභාවේ අංක 11 - ප්‍රධාන පල්ලිය කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**තිළිණ වික්‍රමරත්න,**
තේරීම්භාර නිලධාරි,
අක්කරෙයිපත්තු මහ නගර සභාව.

2020 ජුනි මස 19 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.